සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020(I)**

| කාලය: පැය 03 | වර්තමාන ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (23) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

1. ඉන්දියාව සහ චීනය විසින් එකිනෙකා අභිබවා ඉන්දියන් සාගරයේ සිදුකරන ආර්ථික සහ දේශපාලන ක්‍රියාදාමයන්ගෙන් ශ්‍රී ලංකාවට සිදුවන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 20)

2. ශ්‍රී ලංකාවේ ප්‍රධානම ද්විපාර්ශ්වික ණය හිමියා වන චීනයෙන් ස්ථිරසාර ණය සහනයක් ලබා ගැනීම ප්‍රමාද වීම මත ශ්‍රී ලංකාවේ විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී වී ඇති බව ප්‍රකාශිතය. මෙම තත්වය ශ්‍රී ලංකා ආර්ථිකයට කෙසේ බලපාන්නේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 20)

3. රටවල් දෙකක් අතර ඇති කර ගන්නා නිදහස් වෙළඳ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමේදී ඇති වන වාසි අවාසි විග්‍රහ කරන්න. (ලකුණු 20)

4. ශ්‍රී ලංකාවට අයත් උතුරු මුහුදේ දකුණු ඉන්දීය ධීවරයින් විසින් අනවසරයෙන් ධීවර කර්මාන්තයේ යෙදෙන බව නිරන්තරයෙන් නැගෙන චෝදනාවකි. මේ තත්ත්වය සමනය කරගනිමින් ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් ආරක්ෂා කරගැනීමට අප විසින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව විභාග කරන්න. (ලකුණු 20)

5. ශ්‍රී ලංකාවේ සංවර්ධන තත්වය මෑයෙන් 2023 ඔක්තෝබර් මස 03 දින ලෝක බැංකුව විසින් නිකුත් කරන ලද වාර්තාවේ 11 පිටුවෙ මෙසේ සඳහන් වේ.

   "දුර්වල ගෝලීය ආර්ථික ක්‍රියාකාරීත්වයක් හමුවේ, 2023 වසර සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සඳහා ඉල්ලුම අඩු වීමක් සිදු වන අතර ඉහළ බදු සහ අඩු ආදායම හමුවේ දේශීය ඉල්ලුම ද අඩු කරයි. තවද, සැපයුම් දාම ගැටලු සහ ගෙවුම් ශේෂ හිඟය මධ්‍යයේ 2023 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 3.8 කින් හැකිලෙනු ඇතැයි අපේක්ෂා කෙරේ".

   ගෝලීය ආර්ථික පසුබෑම හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා පරිදි පවත්වාගැනීම සඳහා අපනයන ක්ෂේත්‍රයේ ගත යුතු උපායමාර්ග මොනවාද යන්න විග්‍රහ කරන්න. (ලකුණු 20)

**************